සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

තෙවන වාර පරීක්ෂණය 2020

10 ශ්‍රේණිය **කෘෂි හා ආහාර හා තාක්ෂණය - I** කාලය පැය 03 යි.

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි :-
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (1) (2) (3) (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක්, එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01. කලාවැවේ සිට තිසාවැවට ජලය ගෙන යන යෝධ ඇල (ජයගඟ) නිර්මාණය කළ රජතුමා වනුයේ,

(1) මහසෙන් රජතුමාය (2) ධාතුසේන රජතුමාය
(3) දුටුගැමුණු රජතුමාය (4) පරාක්‍රම බාහු රජතුමාය

02. කුඹුරු ලක්ෂයක් තිබුණ නිසා " වෙල්ලස්ස" ලෙස ජන ප්‍රවාදයේ සඳහන් පළාත වන්නේ,

(1) ඌව පළාතයි (2) වයඹ පළාතයි
(3) දකුණු පළාතයි (4) සබරගමුව පළාතයි

03. පෘතුගීසින් හා ලන්දේසීන් ඔවුන් විසින් පරිභෝජනයට ගත්, ලංකාවට හඳුන්වා දුන් බෝග අයත් බාණ්ඩය දැක්වෙන්නේ,

(1) පොල්, මිරිස්, රඹුටන් ය (2) අන්නාසි, පැපොල්, රඹුටන් ය
(3) දෙල්, පොල්, වී ය (4) වී, මෙනේරි, අන්නාසි ය

04. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය සඳහා හිතකර වූ විවිධ පරිසර තත්ව පැවතීම ඉතා වැදගත් ය. නිවැරදි පරිසර තත්වයන්ට අයත් බාණ්ඩයකි.

(1) වර්ෂාපතනය හා භූමියයි (2) වර්ෂාපතනය හා ජලයයි
(3) වර්ෂාපතනය හා ශ්‍රමයයි (4) වර්ෂාපතනය හා භූවිෂමතාවයි

05. සියලුම බෝග සඳහා පොහොර සහනාධාරය ලබාදීම ආරම්භ කරන ලද්දේ කුමන වර්ෂයේ දී ද?

(1) 2010 දී ය. (2) 2011 දී ය. (3) 2012 දීය. (4) 2014 දී ය.

06. හරිත විප්ලවය සමඟ කෘෂි කර්මාන්තයේ සිදු වූ වෙනස් කම් පිළිබඳ ප්‍රකාශයන් තුනක් පහත දක්වා ඇත.

A - වැඩි දියුණු කරන ලද බෝග ප්‍රභේද හඳුන්වා දී ම හා කෘෂි නිෂ්පාදන වල ඵලදායිතාවය වැඩි කිරීම
B - අපි වවමු රට නගමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම
C - කෘෂි රසායන ද්‍රව්‍ය හඳුන්වා දීම හා ඒවායේ භාවිතය වැඩි කිරීම

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශ වන්නේ,

(1) A හා B පමණි (2) A හා C පමණි
(3) A හා C පමණි (4) A,B හා C යන සියල්ලම

07. යම් ප්‍රදේශයක කෙටි කාලයක් තුළ වායු ගෝලයේ පවතින ස්වභාවය හඳුන්වන්නේ,

(1) දේශගුණය ලෙසය (2) ආර්ද්‍රතාවය ලෙසය
(3) ආලෝකය ලෙසය (4) කාලගුණය ලෙසය

මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

08. යල කන්නයේ අස්වනු නෙළන මාසය වන්නේ,

(1) ජනවාරි මාසයේ ය (2) පෙබරවාරි මාසයේය.

(3) අගෝස්තු මාසයේය (4) සැප්තැම්බර් මාසයේය

09. ඊසාන දිග මෝසම් සුළඟ මගින් වැසි අපේක්ෂා කළ හැක්කේ කුමන මාස වල දී ද?

(1) මැයි සිට සැප්තැම්බර් මාස වලදීය (2) නොවැම්බර් සිට පෙබරවාරි මාස වලදීය

(3) මාර්තු අප්‍රේල් මාස වලදීය (4) ඔක්තෝම්බර් නොවැම්බර් මාසවලදී ය

10. ආලෝකයේ විවිධ වර්ණ ශාකවල විවිධ වර්ධක අවස්ථා සඳහා උපකාරි වේ. රතු ආලෝකයක උපකාරි වන්නේ,

(1) බීජ පුරෝහනය සහ අතු බෙදීම සඳහාය (2) ප්‍රභාසංස්ලේෂණය සඳහා ය

(3) පර්ව හා බීජාධරයේ වර්ධනය සඳහාය (4) පුෂ්ප හට ගැනීම හා ඵල දැරීම සඳහා

11. විද්‍යාත්මක බෝග වර්ගීකරණයට අනුව ඇරිකේසියේ කුලයට අයත් බෝගයක් වනුයේ,

(1) අඹ ය (2) ඉඟුරු ය (3) රබර් ය (4) පොල්ය

12. ගජබා විද්‍යාලයේ 10 ශ්‍රේණියේ සිසුන් පාසල් ගෙවත්තේ සිටුවීම සඳහා එකතු කරගත් බීජ වර්ග කීපයක් පහත දැක්වෙන පරිදි කවරවල බහා තැබුවේය.

A	B	C	D
රාබු කැරට් ගෝවා	බටු මිරිස් තක්කාලි	කරවිල පතෝල පිපිඤ්ඤා	දඹල මෑ බූෂිටා මෑ හවරි මෑ

මේ අයුරින් අවුලක පෝරා කුරුමිණියා හානි කරන බෝග අයත් බාණ්ඩය වන්නේ,

(1) A ය (2) B ය (3) C ය. (4) D ය

13. ඉහත කාණ්ඩ අතරින් ආහාර වේලට ප්‍රෝටීන් ලබා දෙන බීජ බාණ්ඩය වනුයේ,

(1) A ය (2) B ය (3) C ය. (4) D ය

14. පුෂ්ප හටගැනීම සඳහා දිවා කාලයේ දිග බලපායි. කෙටි දිවා කාලයක් අවශ්‍ය වන බෝග බාණ්ඩය අයත් වනුයේ,

(1) බීට්, කැරට්, රාබුය (2) උක්, කෝපි, මුං ය

(3) පොල්, මිරිස්, කව්පිය (4) රාබු, කෝපි, මිරිස් ය

15. මුහුදු මට්ටමේ සිට උච්චත්වය මීටර් 900 වැඩි දේශගුණික කලාපය ලෙස සලකන්නේ,

(1) උඩරට කලාපය යි (2) මැදරට කලාපය යි

(3) පහත රට කලාපය යි (4) පහත රට අතරමැදි කලාපය යි

16. WM සංකේතයෙන් හඳුන්වන කෘෂි දේශගුණික කලාපය,

(1) උඩරට තෙත් කලාපයයි (2) මැදරට තෙත් කලාපයයි

(3) පහත රට තෙත් කලාපයයි (4) මැදරට අතරමැදි කලාපයයි

17. ආග්නේය පාෂාණයක් ලෙස සලකනු ලබන්නේ,

(1) ක්වාට්ස් ය (2) හුණුගල් ය (3) ෂේල් ය (4) වැලිගල් ය

18. ශාක වලට අවශෝෂණය කරගත හැකි පස තුළ අඩංගු පාංශු ජල තත්වය වනුයේ,

(1) ගුරුත්වාකර්ෂණ ජලයයි (2) කේශාකර්ෂණ ජලයයි

(3) ජලාකර්ෂණ ජලයයි (4) උල්පත් ජලයයි

19. පසෙහි රසායනික ලක්ෂණය කි.

(1) පාංශු ව්‍යුහය (2) පාංශු වර්ණය (3) පාංශු ප්‍රතික්‍රියාව (4) පාංශු ගැඹුර

20. පසක PH අගය 5.4 විය. එම පස,

(1) ප්‍රබල ආම්ලික පසකි (2) ප්‍රබල භාෂ්මික පසකි

(3) ආම්ලික පසකි (4) භාෂ්මික පසකි

21. ශාකවල වර්ධන විලාසය අනුව බෝග පැළෑටි, පඳුරු හා ගස් වශයෙන් වර්ගීකරණය කරයි. ඉහත වර්ගීකරණය අනුව පිළිවෙළින් නිවරදිව දක්වා ඇති බෝග බාණ්ඩය තෝරන්න.

(1) බණ්ඩක්කා, රඹුටන්, පොල් (2) බණ්ඩක්කා, දෙලුම්, රඹුටන්

(3) කෝපි, අන්නාසි, රඹුටන් (4) දෙලුම්, රඹුටන්, මිරිස්

22. බෝග වගාවට සුදුසු පසක තිබිය යුතු පාංශු සංඝටක ප්‍රතිශතය නිවරදිව දක්වා ඇත්තේ කවර බාණ්ඩයේ ද?

(1) ජලය 25% වාතය 25% ඛනිජ 40% කාබනික ද්‍රව්‍ය 10%

(2) ජලය 30% වාතය 20% ඛනිජ 25% කාබනික 25%

(3) ජලය 25% වාතය 25% ඛනිජ 45% කාබනික ද්‍රව්‍ය 5%

(4) ජලය 20% වාතය 25% ඛනිජ 45% කාබනික ද්‍රව්‍ය 10%

23. මැල්වේසි කුලයේ බෝගයක් වන බණ්ඩක්කා වගාවේ උගුල් බෝගයක් ලෙස කපු කිනිස්ස යොදා ගන්නේ කුමන කෘමියා මර්දනය සඳහා ද?

(1) ඉල්මැස්සා (2) රතු කපු මකුණා

(3) ගොයම් මකුණා (4) පළතුරු මැස්සා

24. බෝග වගාව සඳහා කරනු ලබන බිම සැකසීම සම්බන්ධව සාවද්‍ය ප්‍රකාශය කුමක් ද?

(1) බිම් සැකසීම මගින් බෝග වර්ධනයට හිතකර පාංශු තත්ව සපයනු ලැබේ.

(2) මනාව බිම් සැකසීමෙන් වල් පැළ පාලනය වේ

(3) අතුරුයත් ගෑම සිදු කරන්නේ බෝග සංස්ථාපනයට පෙරය

(4) බිම් සැකසීමෙන් පසේ ජල අවශෝෂණ හැකියාව දියුණු වේ

25. පොල් වගාවේ දී පැළ අතර පරතරය විය යුත්තේ,

(1) මීටර් 6 x 6 (2) මීටර් 8 x 8

(3) මීටර් 10 x 10 (4) මීටර් 12 x 12

26. භ්‍රමණ පෝරුව ලෙස හඳුන්වන්නේ,

(1) දැති පෝරුවයි (2) තල පෝරුවයි

(3) රොටවේටරය යි (4) නැමි පෝරුවයි

27. පැළ වල මනා වර්ධනය සඳහා තවාන් පාත්ති වල මතුපිට යෙදීමට නිර්දේශිත තවාන් මිශ්‍රණයේ මතුපිට පස් හා කොම්පෝස්ට් අනුපාතය,

(1) 1 : 1 කි (2) 1 : 2 කි (3) 1 : 3 කි (4) 2 : 1 කි

28. අන්තර් ජාතික පාංශු වර්ගීකරණය අනුව මිලි මීටර් 2 ට වඩා විශාල අංශු,

(1) රොන්මඩය (2) මැටිය (3) බොරලුය (4) සියුම්වැලිය

29. පහත දැක්වෙන්නේ ජල වහනය සඳහා යොදා ගනු ලබන කානු පද්ධතියකි. එය හඳුන්වන්නේ,



(1) උපකානු යනුවෙනි (2) හෙරින්බෝන් කානු යනුවෙනි

(3) සමාන්තර කානු යුනවෙනි (4) ගඩොල් කානු යනුවෙනි

30. වී වගාවේ මතුපිට පොහොර ලෙස යොදා ගන්නා TDM (බන්ඩි පොහොර) වල අඩංගු පෝෂක වන්නේ,

(1) නයිට්‍රජන් හා පොස්පරස් ය (2) නයිට්‍රජන් හා පොටෑසියම් ය

(3) නයිට්‍රජන් හා කාබන් ය (4) නයිට්‍රජන් හා කැල්සියම් ය

31. බෝග වගාවේ දී ත්‍රිත්ව සුපර් පොස්පේට් (T S P) පොහොර බහුලව යොදා ගැනේ. මෙම පොහොර වල අඩංගු පොස්පරස් (P_2O_5) ප්‍රතිශතය.

(1) 20% කි (2) 27% කි (3) 45% කි (4) 60% කි

32. බහු වාර්ෂික වල් පැළෑටි පමණක් අයත් බාණ්ඩය වන්නේ,

(1) කුප්පමේනියා, කළාඳුරු, මොනරකුඩුම්බිය

(2) ඇත්තඩි, ඇටවරා, කලාඳුරු

(3) ගඳපාන, කලාඳුරු, කුප්පමේනියා

(4) ගොඩමාරුක්, නිදිකුම්බා, තුත්තිරි

33. කොම්පෝස්ට් නිපදවීමේ දී අමුද්‍රව්‍යයක් ලෙස යෙදීමෙන් භාෂ්මිකතාව නිසා අමුද්‍රව්‍ය දිරාපත් වීම ප්‍රමාද වන අතරම, කොම්පෝස්ට් පොහොර වල නයිට්‍රජන් ප්‍රතිශතය ද අඩු වේ. එම අමුද්‍රව්‍ය වන්නේ,

(1) ජලජ පැළෑටි හා තෘණ (2) පිදුරු හා ගොම

(3) දැව අළු හා අළුහුණු (4) කුකුල් පොහොර හා රනිල ශාක පත්‍ර

34. වගා භූමියක මිරිස් හා බෝංචි වගාවක පහත රූපිය ලක්ෂණ පෙන්නුම් කරන ලදී.

- පත්‍ර මත අක්‍රමවත් කහ දුඹුරු තද දුඹුරු හෝ කලු පුල්ලි ඇති වීම
- කලු පුල්ලි එකිනෙක යා වී කළු දුඹුරු පාට කළු පුල්ලි ඇති වීම

ඉහත ලක්ෂණ අනුව එම බෝගවලට වැළඳී ඇත්තේ,

(1) වඳ පීදීමය (2) හිටුමැටිමය

(3) ඇන්ත්‍රැක්නෝස්ය (4) පත්‍ර විචිත්‍ර රෝගය

35. පාංශු ක්ෂුද්‍ර ජීවීන්ට උදාහරණයක් ලෙස දැක්විය හැක්කේ,

(1) ශාක මුල් හා නෙමටෝඩාවන් ය (2) ඇල්ගී හා බැක්ටීරියාවන් ය

(3) කුරුමිනියන් හා බැක්ටීරියාවන් ය (4) කුහුඹුවන් හා ගැඩවිලුන් ය

36. පුෂ්ප මුලාකෘති ඇති වීමේ සිට පිදීම දක්වා කාලය වී වගාවේ ප්‍රජනක අවධිය ලෙස හඳුන්වයි. එම කාලය වනුයේ,

(1) දින 20 කි (2) දින 25 කි (3) දින 30 කි (4) දින 35 කි

37. වැඩි දියුණු කරන ලද වී ප්‍රභේද හා සැසඳීමේ දී ශ්‍රී ලංකාවේ පාරම්පරික වී ප්‍රභේද පිළිබඳ නිවරදි ප්‍රකාශය කුමක් ද?

(1) අස්වැන්න ඉතා වැඩිය

(2) ගොයම් ඇද වැටීමට ඔරොත්තු දෙයි

(3) රසායනික පොහොර වලට හොඳින් ප්‍රතිචාර දක්වයි

(4) පරිභෝජනය මගින් නිරෝගී බව ආරක්ෂා වේ

38. අධික වර්ෂාවකින් පසු ගලා යන වැසි ජලය සමඟ බෑවුම් භූමියක පස් අංශු ප්‍රවාහනය වීම අවම කිරීම සඳහා වඩාත් සුදුසු ක්‍රියා මාර්ගය වන්නේ,

(1) පසට වසුන් යෙදීමය (2) වල් පැළෑටි ගළවා දැමීමයි

(3) පසට කාබනික ද්‍රව්‍ය එකතු කිරීමයි (4) සමෝච්ඡ ගල් වැටි දැමීමයි

39. A, B, C, D යනුවෙන් වී බීජ සාම්පල් 4 ක් පිළිබඳ තොරතුරු පහත වගුවේ දක්වා ඇත.

සාම්පලය	පුරෝහන ප්‍රතිශතය	තෙතමන ප්‍රතිශතය	ප්‍රවේණි පාරිශුද්ධතාවය
A	85%	13%	98%
B	70%	18%	90%
C	80%	20%	85%
D	90%	16%	95%

මේවා අතරින් බිත්තර වී ලෙස භාවිතා කිරීමට වඩාත් සුදුසු බීජ සාම්පලය වන්නේ,

(1) A ය. (2) B ය (3) C ය (4) D ය

40. දුඹුරු පැළ කීඩෑවා පාලනය සඳහා ප්‍රතිරෝධී ප්‍රභේදයක් ලෙස B.G. 352 යන වී ප්‍රභේදය හඳුන්වා දුන් පර්යේෂණායතනය වන්නේ,

(1) ගන්නොරුවය (2) මහ ඉලුප්පල්ලමය

(3) බතලගොඩය (4) හිඟුරක්ගොඩය

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

තෙවන වාර පරීක්ෂණය 2020

10 ශ්‍රේණිය **කෘෂි හා ආහාර හා තාක්ෂණය - II** කාලය පැය 01 යි.

නම/ විභාග අංකයඃ

උපදෙස් ඃ
- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නය සඳහා ලකුණු 20 ක් හිමි වන අතර අනෙකුත් සෑම ප්‍රශ්නයක් සඳහා ම ලකුණු 10 බැගින් හිමි වේ.

---

01. බෝග වගාවේ දී පාංශු ලක්ෂණ ප්‍රශස්ත ලෙස පවත්වා ගැනීම මෙන්ම දේශගුණික සාධක පිළිබඳව ද වැඩි අවධානය යොමු කිරීම ඉතා වැදගත් ය.
   - i. මූලික බිම් සැකසීමේ අරමුණු 02 ක් නම් කරන්න.
   - ii. බෝග වගාවේ දී පාංශු වයනය වැදගත් වන ආකාර 02 ක් දක්වන්න.
   - iii. පාංශු වාතයේ වැදගත් කම් 02 ක් සඳහන් කරන්න.
   - iv. බෝග වගාවේ දී කාබනික පොහොර යොදා ගැනීමෙන් අත්වන වාසි 02 ක් නම් කරන්න.
   - v. භූමියේ පාංශු ඛාදනය වළක්වා ගැනීම සඳහා යෙදිය හැකි ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම 02 ක් දක්වන්න.
   - vi. බෝග වගාවේ දී වැදගත් වන දේශගුණික සාධක 02 ක් සඳහන් කරන්න.
   - vii. සුළඟේ වේගය මැනීම සඳහා භාවිතා කරන උපකරණය නම් කර මැන ගනු ලබන ඒකකය සඳහන් කරන්න.
   - viii. බෝග වගාවට උෂ්ණත්වයේ ඇති හිතකර බලපෑම් 02 ක් දක්වන්න.
   - ix. පාංශු ජීවීන්ගේ වැදගත් කම් 02 ක් ලියන්න.
   - x. කෘෂි පාරිසරික කලාප වර්ගීකරණයේ වැදගත් කම් 02 ක් දක්වන්න.

02. කෘෂිකාර්මික කටයුතු වලදී අපේක්ෂිත අස්වනු ලබා ගැනීම සඳහා නිසි අයුරින් ශාක පෝෂක කළමනාකරණය කළයුතුය.
   - i. a. ශාක වර්ධනය සඳහා අත්‍යවශ්‍යය මහා පෝෂ්‍ය පදාර්ථ 04 ක් සඳහන් කරන්න.
     b. ක්ෂුද්‍ර පෝෂ්‍ය පදාර්ථ 04 ක් නම් කරන්න.
   - ii. a. බෝග වගාවට පොටෑසියම් වලින් ඇති ප්‍රයෝජන 02 ක් සඳහන් කරන්න.
     b. පොටෑසියම් ඌණතා ලක්ෂණ 02 ක් දක්වා පොටෑසියම් අඩංගු පොහොර වර්ග 02 ක් සඳහන් කරන්න.
   - iii. a. පොහොර භාවිත කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා සැළකිලිමත් විය යුතු කරුණු 02 ක් ලියන්න.
     b. ඒකාබද්ධ ශාක පෝෂක කළමනාකරණය යනු කුමක් දැ යි හඳුන්වන්න.

03. පළිබෝධහානි, බෝග වගාවේ ඵලදායිතාව අඩු වීමට බලපාන ප්‍රධාන සාධකයකි.
   - i. a. වල් පැළෑටියක් යනු කුමක් දැයි හඳුන්වන්න.
     b. වල් පැළෑටි නිසා බෝග වගාවට සිදුවන අහිතකර බලපෑම් 02 ක් ලියන්න.
   - ii. a. පූර්ණ රූපාන්තරණ සහිත කෘමීන්ගේ ජීවණ චක්‍රයේ අවස්ථා සඳහන් කරන්න.
     b. පූර්ණ රූපාන්තරණ කෘමි පිළිබෝධකයෙක් නම් කරන්න.
   - iii. a. සොලනේසියේ හා කුකර්බිටේසියේ කුලවල බෝගවලට බහුලව වැළඳෙන බැක්ටීරියා රෝගයක් නම් කර රෝග කාරකය ලියන්න.
     b. එම රෝගය පාලනය කරගත හැකි පාලන ක්‍රම 02 ක් ලියන්න.

මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

04. වර්තමානයේ ජලය සීමිත සම්පතක් වන බැවින් ජල කළමනාකරණය කෙරෙහි අවධානය යොමු කිරීම ඉතා වැදගත් ය.



i. a. මෙම ජලසම්පාදන ක්‍රමය නම් කරන්න.

b. එම ජලසම්පාදන ක්‍රමයට යෝග්‍ය බෝගයක් යෝජනා කරන්න.

ii. a. මෙම ජලසම්පාදන ක්‍රමයේ වාසි 02 ක් හා අවාසි 02ක් දක්වන්න.

b. පසෙන් ජලය ඉවත්වන ආකාර සඳහන් කරන්න.

iii. a. බෝග වගාවට ජලයේ ඇති වැදගත් කම් 02 ක් නම් කරන්න.

b. දුර්වල ජලවහණය නිසා ඇතිවන ගැටලු 02 ක් දක්වන්න.

05. තවාන් පාලනයේ දී නීරෝගී හා ශක්තිමත් පැළ ලබා ගැනීම, බෝග වගාවේ දී උපරිම අස්වනු ලබා ගැනීමට බලපාන තවත් සාධකයකි.

i. a. එළවළු පැළ ලබා ගැනීම සඳහා සකස් කළ යුතු තවාන් පාත්තියක සම්මත පළල නම් කරන්න.

b. එම සම්මත පළල යොදා ගැනීමට බලපාන හේතුව දක්වන්න.

ii. a. යල කන්නයේ දී වියලි කලාපයට සුදුසු තවාන් පාත්ති වර්ගය නම් කරන්න.

b. තවාන් නොදමා කෙළින්ම ක්ෂේත්‍රයේ සිටුවන බෝග වර්ග 02 ක් දක්වන්න.

iii. තවාන් පාත්ති ජීවානුහරණය කළහැකි ක්‍රමයක් නම් කර එය කෙටියෙන් විස්තර කරන්න.

06. ශ්‍රී ලාංකිකයින්ගේ ප්‍රධාන ආහාරය බත්ය. එමෙන්ම ආහාර සුරක්ෂිතතාව ඇති කර ගැනීමට වී වගාව ප්‍රධාන තැනක් ගනියි.

i. a. ශ්‍රී ලංකාවේ වී වගාවට ඇති විභවයන් 04 ක් නම් කරන්න.

b. ශ්‍රී ලංකාවේ පාරම්පාරික වී ප්‍රභේද 04 ක් නම් කරන්න.

ii. a. වි වගාවට හානි කරන වල් පැළෑටි කාණ්ඩ 03 නම් කරන්න.

b. වී වගාවේ වල් පැළෑටි පාලනයට ගත හැකි ක්‍රියාමාර්ග 04 ක් සඳහන් කරන්න.

iii. a. කිරි වදින වී බීජවල යුෂ උරා බි හානි සිදු කරන කෘමියා නම් කරන්න.

b. එම කෘමියා මර්ධනය කළ හැකි ක්‍රමයක් සඳහන් කරන්න.

07. විවිධත්වයෙන් යුත් බෝග කීපයක් කිසියම් ක්ෂේත්‍රයක ස්ථාපිත කිරීමෙන් බෝග වගා කටයුතු පාලනය පහසු වේ.

i. a. කෘෂි කාර්මික බෝග වර්ගීකරණයේ නිර්ණායක 04 ක් දක්වන්න.

b. වී බෝගයේ විද්‍යාත්මක නාමය සඳහන් කරන්න.

ii. a. බෝග වගාවේ දී බෝග වර්ගීකරණය ප්‍රයෝජනවත් වන අවස්ථා 02 ක් දක්වන්න.

b. අතුරු යත් ගෑමේ උපකරණ 02 ක් ලියන්න.

iii. a. බෝග සංස්ථාපනය කරණ ප්‍රධාන ක්‍රම 02 සඳහන් කරන්න.

b. බෝග සිටුවීමේ දී නිවැරදි ගැඹුර හා පරතරය භාවිත කිරීමේ ප්‍රයෝජන 02 ක් ලියන්න.

පිළිතුරු පත්‍රය - I කොටස

1 -(2)	2 -(1)	3 -(2)	4 -(4)	5 -(2)	6 -(3)	7 -(4)	8 -(3)	9 -(2)	10 -(2)
11-(4)	12 -(3)	13 -(4)	14 -(2)	15 -(1)	16 -(2)	17 -(1)	18 -(2)	19 -(3)	20 -(3)
21-(2)	22 -(3)	23 -(2)	24 -(3)	25 -(2)	26 -(3)	27 -(1)	28 -(3)	29 -(2)	30 -(2)
31-(3)	32 -(2)	33 -(3)	34 -(3)	35 -(2)	36 -(3)	37 -(4)	38 -(4)	39 -(1)	40 -(3)

(නිවැරදි පිළිතුරට ලකුණු 02 බැගින්)

II කොටස

(01) (i) ● වල් පැළ පාලනය ● ජල අවශෝෂණ හැකියාව දියුණු කිරීම
(අදාළ වෙනත් පිළිතුරු ඇත්නම් ලකුණු ලබා දෙන්න) (ල. 1 × 2 = 02)

(ii) ● පසට ගැළපෙන බෝග තෝරා ගැනීම ● වගාවට සුදුසු පරිදි පසේ වයනය දියුණු කිරීම
● බිම් සැකසීමට සුදුසු උපකරණ තෝරා ගැනීම ● උචිත ජලසම්පාදන ක්‍රම තෝරා ගැනීම
● පාත්ති වර්ග තීරණය කිරීම (ල. 1 × 2 = 02)

(iii) ⋆ බීජ පුරෝහණයට ⋆ ශාක මූල මණ්ඩල ශ්වසනයට ⋆ කාබනික ද්‍රව්‍ය වියෝජනයට (ල. 1 × 2 = 02)
(අදාළ වෙනත් පිළිතුරු ඇත්නම් ලකුණු ලබා දෙන්න)

(iv) ● කැටායන හුවමාරුධාරිතාව වැඩි දියුණු කිරීම ● ක්ෂුද්‍ර ජීවී ගහණය වැඩි කරයි.
● P - H අගය නොවෙනස්ව පවත්වා ගනියි. ● ජල අවශෝෂණ ධාරිතාව වැඩි දියුණු කරයි.
(ල. 1 × 2 = 02)

(v) ⋆ වසුන් යෙදීම ⋆ සමෝච්ච ක්‍රමයට බෝග සිටුවීම ⋆ ආවරණ බෝග වගාව ⋆ අවම බිම් සැකසීම
(ල. 1 × 2 = 02)

(vi) ● වර්ෂාපතනය ● උෂ්ණත්වය ● ආලෝකය ● සාපේක්ෂ ආර්ද්‍රතාව ● සුළඟ
(ල. 1 × 2 = 02)

(vii) ⋆ අනිලමානය ⋆ පැයට කිලෝ මීටර් (kmh^{-1}) (ල. 1 × 2 = 02)

(viii) ● බීජ ප්‍රරෝහණය ● දඬු කැබලි මුල් අද්දවා ගැනීම ● ජලය හා ලවණ අවශෝෂණය
● ආකන්ධ ඇතිවිම ● පුෂ්ප ඇතිවීම (ල. 1 × 2 = 02)

(ix) ● කාබනික ද්‍රව්‍ය වියෝජනය ● පස් මිශ්‍ර කරයි ● පාංශු කැටිති ඇතිකරයි. (ල. 1 × 2 = 02)

(x) ⋆ කන්න අනුව වගා කටයුතු සැළසුම් කිරීම ⋆ සුදුසු බෝග නිර්දේශ කළ හැකි වීම
⋆ කෘෂිකාර්මික ඉඩම් කලාපිකරණයට උපකාරී වීම
⋆ සමාකාර දේශගුණික තත්ව ඇති ප්‍රදේශ හඳුනා ගැනීම (ල. 1 × 2 = 02)

02. (i) a. ⋆ C, H, O, N, P, K, Ca, mg, S (ල. ½ × 4 = 01)
b. - Zn, cu, mn, mo, B, Fe, Cl, (ල. ½ × 4 = 01)

(ii) a. ⋆ පුෂ්පීකරණයට හා ඵල හට ගැනීම ⋆ එන්සයිම ක්‍රියාකාරිත්වය
⋆ පටක වර්ධනයට (ල. ½ × 2 = 01)

b. ⋆ පත්‍ර දාර කහපාට වේ. ⋆ පත්‍ර දාර පිළිස්සුණු ස්වභාවයන් ය
⋆ මියුරියේට් ඔෆ් පොටෑෂ් ⋆ සල්ෆේට් ඔෆ් පොටෑෂ් (ල. 1 × 2 = 02)

(iii) a. ⋆ පසේ අඩංගු පෝෂක ප්‍රමාණය ⋆ දේශගුණික තත්වය ⋆ පසේ තෙතමන තත්වය
⋆ පොහොර යෙදීමේ ක්‍රම අනුගමනය (ල. 1× 2= 02)

b. ⋆ කාබනික පොහොර යොදා ගනිමින් පසෙහි භෞතික රසායනික හා ජෛව ලක්ෂණ සංවර්ධනය කර ගනිමින් බෝගයේ පෝෂණ අවශ්‍යතා සපිරෙන පරිදි රසායනික පොහොර යෙදීමයි. (ල. 03)

03. (i) a. වගාකරන ලද බෝගය හැරුණු විට එම වගා බිමෙහි වැඩෙන ඕනෑම පැළෑටියක් වල් පැළෑටියක් ලෙස හඳුන්වයි. (ල. 02)

b. ● පෝෂක, හිරුඑළිය හා ජලය හා ඉඩකඩ සමග තරග කරයි.
● වල් පැළෑටි බීජ නිසා අස්වනු වල ගුණාත්මය අඩුවේ.
● ක්ෂේත්‍ර කටයුතු අපහසු වේ. (අදාළ වෙනත් පිළිතුරු ඇත්නම් ලකුණු ලබා දෙන්න)
(ල. ½ × 2 = 01)

(ii) a. ★ බිත්තර ⟶ කීටයා ⟶ පිළවා ⟶ සුහුඹුලා

b. ★ අවුලක පෝරා කෘමියා, එපිලැක්කා කෘමියා, ඉල් මැස්සා

(iii) a. ★ හිටුමැරීම (ල. 01)

★ සියුඩොමොනාස් (ල. 01)

b. ★ බෝග මාරුව ★ ප්‍රතිරෝධී ප්‍රභේද වගා කිරීම

★ මනාලෙස ජලවහනය කිරීම ★ රෝගී ශාක වගා බිමෙන් ඉවත් කිරීම (ල. 1 × 2 = 02)

04. (i) a. ★ බිංදු ජලසම්පාදනය (ල. 01)

b. ★ පොල්, ගස්ලබු, පේර (අදාල පිළිතුරු ඇත්නම් ලකුණු ලබා දෙන්න) (ල. 01)

(ii) a. ● වාසි :- ★ ජලසම්පාදන කාර්යක්ෂමතාව වැඩියි ★ ජලය අපතේ නොයයි

★ වල්පැළ වර්ධනය පාලනය වේ. (ල. ½ × 2 = 01)

● අවාසි :- ★ තාක්ෂණික දැනුම අවශ්‍යයි ★ නිතර නඩත්තු කළ යුතුය

★ අතුරු යත් ගැමේ දී තළ වලට හානි වෙයි. (ල. ½ × 2 = 01)

b. ★ උත්ස්වේදනය ★ වාෂ්පීකරණය ★ පෘෂ්ඨීය අපදාවය ★ වැස්සීම (ල. ½ × 4 = 02)

(iii) a. ★ ප්‍රභාසංශ්ලේෂණය ඇතුළු කායික ක්‍රියාවලිය සඳහා ★ බීජ පුරෝහණයට

★ බීජ පැළ සිටුවීම සඳහා (අදාළ පිළිතුරු ඇත්නම් ලකුණු ලබා දෙන්න) (ල. 1 × 2 = 02)

b. ★ පාංශු වාතය දුර්වල වීම ★ මීතේන් වැනි විෂ වායු උත්පාදනය

★ පසේ රසායනික ගුණාංග පිරිහීම (අදාළ වෙනත් කරුණු ඇත්නම් ලකුණු ලබා දෙන්න)

(ල. 1 × 2 = 02)

05. (i) a. ★ 1m - (ල. 01)

b. ★ ජලය යෙදීම ★ පොහොර යෙදිම ★ වල්පැළ නෙළීම (ල. 1 × 2 = 02)

(ii) a. ● ගිල්වූ තවාන් (ල. 01)

b. ● කව්පි, මුං, තල (ල. 1 × 2 = 02) (අදාළ වෙනත් කරුණු ඇත්නම් ලකුණු ලබා දෙන්න)

(iii) a. ★ සූර්ය තාපය මගින් ★ පිළිස්සීම ★ උණු ජලය මගින් ★ රසායනික ද්‍රව්‍ය භාවිතය

(ල. 1 × 2 = 02) විස්තරයට - ල. 02

06. (i) a. ● අභිජනන මධ්‍යස්ථාන පිහිටා තිබීම ● පොහොර සහනාධාර ලැබීම ● වගා රක්ෂණ ක්‍රම

● සහතික මිලක් තිබීම (ල. ½ × 4 = 02)

b. ● මඩතවාලු ● කලු හීනටි ● කුරුලු තුඩ ● සුවඳැල් (ල. ½ × 4 = 02)

(ii) a. ★ තෘණ ★ පළල් පත්‍ර ★ පන් වර්ග (ල. 1 × 2 = 02)

b. ★ නිවැරදි බිම් සැකසීම ★ ගුණාත්මක බිත්තර වී භාවිතය ★ ඇළවේළි, නියරවල් පිරිසිදුව තබා ගැනීම

★ වැපිරීම වෙනුවට පැළ සිටුවීම (ල. ½ × 4 = 02)

(iii) a. ★ ගොයම් මැස්සා (ල. 01)

b. ★ රසායනික ද්‍රව්‍ය භාවිතය ★ එකවර කන්නයට වගා කිරීම (ල. 01)

07. (i) a. ● ප්‍රයෝජන අනුව ● වැඩෙන පරිසරය අනුව ● බෝගවල වර්ධන විලාසය

● බෝගවල වයස (ල. ½ × 4 = 02)

b. ඔරයිසා සැටයිවා (ල. 01)

(ii) a. ★ බිම් සැකසීම ★ පොහොර යෙදීම ★ බද්ධ කිරීම සඳහා ශාක තෝරා ගැනීම

(අදාළ වෙනත් පිළිතුරු ඇත්නම් ලකුණු ලබා දෙන්න)

(ල. 1 × 2 = 02)

b. උඳුල්ල, හෝ වර්ග (ල. 01)

(iii) a. ★ කෙළින්ම ක්ෂේත්‍රයේ බීජ සිටුවීම ★ තවාන් කර පැළ සිටුවීම (ල. 02)

b. ★ පුරෝහණය පහසු වීම ★ අතු පැතිරීම සඳහා ඉඩකඩ

★ මුල් වර්ධනයට අවශ්‍ය ඉඩකඩ ★ රෝග හා පළිබෝධ හානි අවම වීම (ල. 1 × 2 = 02)